විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

2011 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශුන්‍ය වන නමුත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු. 408,080 ක් වූ පරිගණක උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

1.2.2 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 වගන්තිය ප්‍රකාර අර්ථසාධක අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචන**

2:1. **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම රු.1,505,456,593 ක වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම රු.1,442,849,704 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහ රු.62,606,889 ක වර්ධනයක් සඳහා ආයෝජන පොළී සඳහා වූ ආදායම් බදු රු.30,535,587 කින් අඩුවීම ආයෝජන ආදායම් 6,771,174 කින් වැඩිවීම සහ පෙර වර්ෂවල රඳවාගත් ලාභය රු.25,401,976 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්යසාධනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>දායක මුදල් සාවද්‍ය ලෙස ගණනය කිරීම</u>

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී 2011 මැයි 11 දින දක්වා වැටුප සමඟ අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගෙන තිබූ අතර ඒ අනුව වැඩිපුර ගෙවා ඇති මුදල් අරමුදලින් ආපසු අය කිරීමට හෝ හිලව් කිරීමට මෙතෙක් කටයුතුකර නොතිබුණි. මේ අනුව 2004 වර්ෂයේ සිට 2011 මැයි 11 දක්වා විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන හා කොමිෂන් සභාව විසින් දළ වශයෙන් රු.මිලියන 248.57 ක අර්ථසාධක අරමුදලට වැඩිපුර බැර කර තිබුණි.

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාලය පනතේ XII වන පරිච්ඡේදයේ 95 වන වගන්තිය අනුව දායකයකුගේ බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුගේ ගිණුම අවසන් කරනු ලැබූ උන සිට මාස 03 ක කාල සීමාවක් ඇතුලත දායකයා වෙත ගෙවිය යුතු යැයි නියම කර තිබුණද, මාස 02 ක ගෙවීම් වවුචර් වල නියැදියක් අදාල ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂය තුල ඉහත කාල සීමාව ඉක්ම වීමෙන් පසු ගෙවීම් කර තිබු අවස්ථා පහක් නිරීක්ෂණය විය.

3.2. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

2011 දෙසැම්බර් 31 දිනට හදුනා නොගත් දායක ශේෂයන්ගේ වටිනාකම රු. 6,819,802 ක් වු අතර එම දායක ශේෂයන් හදුනාගැනීමට පියවර ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් ද, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) හදුනා නොගත් දායක ගිණුම්

(ආ) නියමාවලි සකස් කිරීම

**අමුණුම - 01**

| වවුචර් අංකය | විස්තරය | දායක මුදල | සේවය අවසන් කල දිනය | වි.වි.ප්‍ර.කො. අයදුම්පත් ලද දිනය | ගෙවූ දිනය | මාස 03 ක් ඉක්මවා ගිය කාලය | දායකයාට අහිමිවූ පොලිය |
|---|---|---|---|---|---|---|---|
| 578 | ටී.කරිතාලන් | 80,082.77 | 2010.11.29 | 2010.12.27 | 2011.04.31 | දින 25 | 950.38 |
| 832 | කේ.සුන්දරේශ්වරන් | 1,202,008.37 | 2009.10.15 | 2011.01.14 | 2011.05.10 | දින 27 | 14273.84 |
| 335 | කේ.ජී.යූ.ටී.කුමාරසිංහ | 53,680.05 | 2010.09.03 | 2010.09.30 | 2011.03.25 | දින 26 | 424.96 |
| 329 | ඩබ්ලිව්.පී. එස්.සී.කේ විජේසිංහ | 25857.65 | 2010.09.20 | 2010.12.22 | 2011.03.25 | දින 26 | 307.05 |
| 331 | ඩබ්ලිව්.එච්.එම්.ටී.පී. එදිරිසිංහ | 53680.05 | 2010.09.03 | 2010.11.11 | 2011.03.25 | දින 26 | 424.96 |